**SAMODHANA JOURNAL**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

2024 Volume 13 Issue I

# ජන සාහිත්‍යයෙන් නිරූපණය වන ඌව වෙල්ලස්ස නිදහස් සටන් අරගලය හා සම්බන්ධ අප්‍රකට තොරතුරු පිළිබඳ අධ්‍යයනයක් (මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින ජන කවි සහ ජනශ්‍රැති ඇසුරෙන්)

ඩබ්ලිව්.එම්. දීපිකා තුෂාරි දමයන්ති[1] , ආචාර්ය දර්ශන බණ්ඩාර[2]

Received Date: 13th August 2024
Accepted Date: 08th May 2025
Published Date: 29th October 2025

## Abstract

Although folk literature is often considered a creation made by ancient, unarmed villagers for their own enjoyment, it is clear that it contains contemporary social events related to their folk life. That is why folk literature can be used in the study of history. In terms of Sri Lankan historiography, it can be recognized that it has been limited to the capital city and the elite class, focusing primarily on presenting the main points. There is a situation where the non-elite history connected to the ordinary people's life in Sri Lanka, which has such a history, has been lost. Folk literature is a valuable source that can aid in the study of phenomena that have been lost from written history. Through this study, we attempted to find out what information is represented about the Uva Wellassa Independence Struggle of 1818 through the folk poems and folklore of the Monaragala area. To find solutions to the question. This study employed both the library survey method and the field study method. The primary objective of this study was to document a history that is being lost in a remote area, one that is not mentioned in written history and receives little attention from researchers. Studying areas that receive little attention from researchers and socializing that knowledge is one of the main importance of the study. Through this study was able to identify several facts that are mentioned and not mentioned in the main historical stream of folk literature. The situation in Uva Wellas in the 16th-17th centuries, that is, before the start of the struggle, the beginning of the 1818 freedom struggle, and information about the elite and non-elite individuals who led the struggle. The strategic actions taken by the Sinhalese, the oppression faced by the common people, and this study were able to identify the repressive measures taken by the British to thwart the first independence struggle of the Sinhalese through the folk poems and folklore of the Monaragala district.

**Keywords:** Uva Wellassa Independence Struggle, Folk Poetry, Folklore, Monaragala

## සංක්ෂේපය

ජන සාහිත්‍ය වනාහි ඉපැරණි, අවියත් ගැමියන් සිය රසඥතාව අරමුණු කරගෙන සිදු කරන ලද නිර්මාණයක් ලෙස සැළකුව ද ඒ තුළ අන්තර්ගත ව ඇත්තේ ඔවුන්ගේ ජන ජීවිතය හා බද්ධ ව පවතින සමකාලීන සමාජ සිදුවීම් බව පැහැදිලි ය. ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේ දී ජන සාහිත්‍යය උපයෝගී කරගත හැක්කේ එබැවිනි. ශ්‍රී ලාංකේය ඉතිහාසකරණය ගත් කල එය අගනුවර කේන්ද්‍ර, ප්‍රභූ පැලැන්තියට පමණක් සීමා වෙමින්, ප්‍රධාන කරුණු පමණක් රචනා කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කර ඇති බවක් හඳුනාගත හැකි ය. එවන් ඉතිහාසයක් හිමි ලංකාවේ සාමාන්‍ය ජන ජීවිතය හා බද්ධ නිර්ප්‍රභූ ඉතිහාසය නිරායාසයෙන් ම ගිලිහී ගොස් ඇති තත්ත්වයක් පවතී. ජන සාහිත්‍යය, එලෙස ලිඛිත ඉතිහාසයෙන් ගිලිහී ගොස් ඇති සංසිද්ධීන් අධ්‍යයනයට ඉවහල් කරගත හැකි වැදගත් මූලාශ්‍රයකි. මෙම අධ්‍යයනය මගින් අප උත්සාහ කරන ලද්දේ "මොණරාගල ප්‍රදේශයේ ජන කවි සහ ජනශ්‍රැති මගින් 1818 ඌව වෙල්ලස්ස නිදහස් අරගලය පිළිබඳ නිරූපණය වන තොරතුරු මොනවා ද?" යන පැනයට විසඳුම් සෙවීමටයි. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යන ක්‍රම ද්විත්වය භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ලිඛිත ඉතිහාසය තුළ සඳහන් නොවන, පර්යේෂකයන්ගේ අඩු අවධානයක් යොමු වන ප්‍රත්‍යන්ත ප්‍රදේශයක ගිලිහී යමින් පවතින ඉතිහාසය රචනා කර තැබීමේ අවශ්‍යතාවය මෙම අධ්‍යයනය සඳහා අප යොමු කෙරුණු මුඛ්‍ය අරමුණයි. පර්යේෂකයන්ගේ අඩු අවධානයට ලක් වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය කර එම දැනුම සමාජගත කිරීම අධ්‍යයනයේ ප්‍රධාන වැදගත්කමකි. මම අධ්‍යයනය හරහා ජන සාහිත්‍යයේ ප්‍රධාන ඉතිහාස ධාරාව තුළ සඳහන් වන මෙන් ම සඳහන් නොවන කරුණු ගණනාවක් හඳුනාගත හැකි විය. 16 - 17 සියවස්වල එනම් අරගලය ආරම්භයට පෙර ඌව වෙල්ලස්සේ පැවති තත්ත්වය, 1818 නිදහස් අරගලයේ ආරම්භය මෙන් ම සටනේ නායකත්වය ගත් ප්‍රභූ, නිර්ප්‍රභූ පුද්ගලයන් පිළිබඳව ද තොරතුරු හඳුනා ගැණිනි. සිංහලයන් අනුගමනය කළ උපක්‍රමශීලී ක්‍රියා කලාපයන්, සාමාන්‍ය ජනතාවට මුහුණ දීමට සිදු වූ තාඩන පීඩන මෙන් ම ඉංග්‍රීසීන් සිංහලයන්ගේ පළමු නිදහස් අරගලය ව්‍යර්ථ කිරීමට අනුගමනය කළ [1]මර්දනකාරී ක්‍රියා පිළිවෙත පිළිබඳ ව මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින ජන කවි සහ ජනශ්‍රැති ඇසුරෙන් හඳුනා ගැනීමට මෙම අධ්‍යයනයෙන් හැකි විය.[2]

**ප්‍රමුඛ පද** : ඌව වෙල්ලස්ස නිදහස් සටන, ජනකවි, ජනශ්‍රැති, මොණරාගල

## හැඳින්වීම

"ඉතිහාසය තුළ කී දෙයට වඩා නොකියූ දේ වැඩි ය." යනු ජනප්‍රවාදයේ එන ප්‍රකට කියමනකි. ලාංකේය ප්‍රධාන ඉතිහාස ධාරාව තුළ එන තොරතුරු සහ අප්‍රධාන ඉතිහාස තොරතුරු පිළිබඳ ව සූක්ෂම ව අධ්‍යයනය කිරීමේ දී එකී අදහස සාවද්‍ය නොවන බවට තහවුරු වන අවස්ථාවන් ගණනාක් පවතින බව පැහැදිලි කරුණකි. ඉතිහාසකරණයේ නියැලීම පුරාතනයේ පටන් ම ලාංකේය ප්‍රභූ පැලැන්තිය විසින් ඔවුන්ට අවශ්‍ය පරිදි සිදු කිරීම තුළ ලක් ඉතිහාසයට අත්ව ඇති ඛේදජනක ඉරණමක් වන්නේ සාාමන්‍ය ජනයාගේ ජන ජීවිතය පිළිබඳ තොරතුරු විශාල වශයෙන් යටපත් වීමයි. එලෙස යටපත් ව ඇති සාමාජීය තොරතුරු ලබාගත හැකි ප්‍රධානත ම මූලාශ්‍රයක් ලෙසට ජන සාහිත්‍යය

[1,2]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර

සඳහන් කළ හැකි ය. කවදා, කොතැන, කෙලෙස, කවුරුන් විසින් ආරම්භ කළේ ද යන්න නිශ්චිත නොවූව ද ජන සාහිත්‍යය යනු පුරාතනයේ පටන් සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙසට සඳහන් කළ හැකි ය. ජන කවි, ජන ප්‍රවාද, නැටුම් - ගැයුම්, ජනශ්‍රැති ආදී බොහෝ අංග ජන සාහිත්‍යයට අයත් අතර පාරම්පරික ව ගලා එන ජන සාහිත්‍යය තුළ නිරායාසයෙන් ම සමකාලීන ඉතිහාස තොරතුරු ගැබ් වී පවතින්නේ ඒවා සියල්ල එදිනෙදා සමාජයේ පවතින සංසිද්ධීන් සමග ගැටෙමින් සිටි සාමාන්‍ය ජනයාගේ නිර්මාණයන් වන බැවිනි. ජන කවි, ජනශ්‍රැති බිහිවීමට පාදක වන්නේ එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යාමේ දී සාමාන්‍ය ජනයාට මුහුණදීමට සිදු වන අත්දැකීම් සමුදායයි. ඒ මත නිරායාසයෙන් ම සමකාලීන සමාජ තොරතුරු ඒවාට ඇතුළත් වීම සිදු වේ. එලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින ජන කවි සහ ජනශ්‍රැති තුළ අන්තර්ගත 1818 නිදහස් අරගලය පිළිබඳ අප්‍රකට තොරතුරු යළි කියැවීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරිණි. 1818 නිදහස් අරගලය පිළිබඳ ලිඛිත මූලාශ්‍රය සාධක රාශියක් පැවතිය ද ඒ තුළ අන්තර්ගත ව බහුලව ම අන්තර්ගත ව ඇත්තේ ප්‍රකට මෙන් ම ප්‍රභූ තොරතුරු පමණි. 1818 නිදහස් අරගලය පිළිබඳ සිදු ව ඇති අධ්‍යයනයන්වල ද අවධානය බහුල ව යොමු වී ඇත්තේ ප්‍රධාන කරුණු කෙරෙහි පමණකි. මෙකී තත්ත්වය තුළ එලෙස ප්‍රධාන ඉතිහාස ධාරාව තුළ සඳහන් නොවන අප්‍රකට තොරතුරු පිළිබඳ ව ජන සාහිත්‍යයේ ප්‍රධාන කොටස් වන ජන කවිය සහ ජනශ්‍රැතිය ඇසුරෙන් විමර්ශනාත්මක ව කියවීමට මෙහිලා අප උත්සාහ කරන ලදී. 1818 ප්‍රථම නිදහස් අරගලය පිළිබඳ මොණරාගල දිස්ත්‍රික්කයේ ගැමියන් තුළ පවතින ජන කවි සහ ජනශ්‍රැති ආශ්‍රිත තොරතුරු හඳුනාගෙන එම තොරතුරු එක් එක් ක්ෂේත්‍ර වශයෙන් පෙළගැස්වීමට අප උනන්දු විය.

## අධ්‍යයන ගැටලුව

කිසියම් ජන කණ්ඩායමක සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට භාවිත කළ හැකි ප්‍රධානත ම ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙසට ජන සාහිත්‍යය අර්ථකථනය කළ හැකි ය. ඒ අතුරින් සමකාලීන සමාජ තොරතුරු මත පදනම් ව නිර්මාණය වන ජන කවිය සහ ජනශ්‍රැතිය සමකාලීන ඉතිහාස තොරතුරු අධ්‍යයනයට ඉවහල් වන ප්‍රධාන ජන සාහිත්‍යාංග ද්විත්වය බව පැහැදිලි ය. ''මොණරාගල ප්‍රදේශයේ ජන කවි සහ ජනශ්‍රැති මගින් 1818 ඌව වෙල්ලස්ස නිදහස් අරගලය පිළිබඳ නිරූපණය වන තොරතුරු මොනවා ද?'' අධ්‍යයන ගැටලුව මුල් කරගෙන මෙම අධ්‍යයනය සිදු කෙරිණි.

### අධ්‍යයනයේ අරමුණු සහ වැදගත්කම

මෙම අධ්‍යයනයේ දී අපගේ අවධානය යොමු කරන ලද්දේ මොණරාගල දිසත්‍රික්කයේ පවතින ජන කවි සහ ජනශ්‍රැතිවල අන්තර්ගත 1818 නිදහස් අරගලය පිළිබඳ තොරතුරු හඳුනාගැනීම කෙරෙහි ය. සමකාලීන ඉතිහාසගත තොරතුරු ඇතුළත් ජන සාහිත්‍ය තුළ එන 1818 නිදහස් අරගලය පිළිබඳ අප්‍රකට, ප්‍රධාන ඉතිහාස ධාරාව තුළ රචනා වී නොමැති මෙන්ම ඉතිහාසයෙන් ගිලිහී යමින් පවතින තොරතුරු අධ්‍යයනය කිරීම සහ එම තොරතුරු සමාජගත කිරීම මෙම අධ්‍යයනය සඳහා අප යොමු කෙරුණු මුඛ්‍ය අරමුණු වේ. පුරාතනයේ පටන් ලාංකීය ඉතිහාසකරණය තුළ අගනුවර කේන්ද්‍ර කරගත් ප්‍රභූ ඉතිහාසය රචනා කිරීමට පමණක් ප්‍රමුඛත්වය ලබා දීම තුළ අගනුවරින් දුරබැහැර ප්‍රත්‍යන්ත ප්‍රදේශවල ඉතිහාස තොරතුරු මෙන් ම සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳ තොරතුරු ගිලිහී ගොස් ඇති ආකාරයක් හඳුනාගත හැකි ය. එවන් තත්ත්වයක් තුළ බොහෝ දෙනෙකුගේ අවධානයට ලක් නොවන මොණරාගල වැනි ප්‍රදේශයක නිර්ප්‍රභූ ජනයාගේ ඉතිහාසය රචනා කර තැබීම මෙම අධ්‍යයනයේ

වැදගත්කමකි. එමෙන් ම එලෙස සැඟව යන තොරතුරු උද්දීපනය කිරීම මගින් එම තොරතුරු අනාගත පර්යේෂකයන්ගේ ප්‍රයෝජනය පිණිස රචනා කර තැබීම සහ ජාතික ඉතිහාසයට එම තොරතුරු එකතු කිරීම මෙම අධ්‍යයනය සඳහා අප යොමු කෙරුණු අරමුණක් මෙන් ම අධ්‍යයනයේ වැදගත්කමක් ද වේ.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය පුස්තකාල සමීක්ෂණය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද මත පදනම්ව රැස් කරන ලද ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත විවරණය කිරීමෙන් නිරීක්ෂණ සහ නිගමනලට පැමිණි සමාජ විද්‍යා ශික්ෂණයේ පර්යේෂණ ක්‍රමවේද මගින් සිදු කරන ලදී. පුස්තකාල සමීක්ෂණය හරහා ප්‍රාථමික මෙන්ම ද්විතියීක මූලාශ්‍රවල සඳහන් තොරතුරු අධ්‍යයනය කරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ ප්‍රස්තුත ප්‍රදේශයට ගොස් දත්ත එක්රැස් කිරීම සිදු කෙරිණි. එහිදී අප්‍රකට ඉතිහාස තොරතුරු රැස් කිරීමේ දී වඩාත් උචිත සම්මුඛ සාකච්ඡා ක්‍රමය මෙන්ම වාචික ඉතිහාස දත්ත එකතු කිරීමේ ක්‍රමය භාවිතයට ගැනිණි. දත්ත දායකයාගේ අනුදැනුම පරිදි පටිගත කරන ලද දත්ත නැවත අනුපිටපත් වශයෙන් සකස් කර, සමවර්ගීය දත්ත වෙන් කර ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව වෙන් වෙන් වශයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය මෙහිදී අනුගමනය කරන ලදී.

**විමර්ශනය**

ඉන්දියන් සාගරයේ සුවිශේෂී සන්ධිස්ථානයක පිහිටි සශ්‍රීකත්වයෙන් අනූන රටක් ලෙසට ලංකාව ලෝකයේ ප්‍රචලිත වීමේ ප්‍රධානත ම ප්‍රතිඵලය වන්නේ බටහිර ජාතීන්ගේ අවධානය වැඩි වශයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමයි. පිළිවෙළින් පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යන යුරෝපා ජාතිකයන් සිය වෙළඳ අරමුණු මුල් කර ගනිමින් ලංකාව ආක්‍රමණය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වූයේ සියවස් ගණනාවක් ලංකාව යුරෝපා ජාතීන්ගේ යටත් විජිතයක් බවට පත්ව පැවතීමයි. පෘතුගීසි සහ ලන්දේසි ජාතිකයන්ට ලංකාවේ උඩරට ප්‍රදේශ යටත් කරගත නොහැකි වුව ද ඉංග්‍රීසීන් උපක්‍රමශීලී ව උඩරට ද යටත් කර ගනිමින් ක්‍රි.ව. 1815 දී සමස්ත ලංකාව ම යටත් විජිතයක් බවට පත් කර ගන්නා ලදී. නමුත් ඔවුන් පොරොන්දු වූ පරිදි සිය පරිපාලනය සාධාරණ ලෙස පවත්වා නොගැනීම හේතුවෙන් වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ ඔවුන්ගේ පාලනයට විරුද්ධව සිංහලයන්ගේ නැගී සිටීම ආරම්භ විය. එලෙස දේශයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට ගැනීමට ඌවේ ජනතාව දරන ලද ප්‍රයත්නයේ අති විශිෂ්ට අවස්ථාව වනුයේ ක්‍රි.ව. 1818 උඩරට නිදහස් සටන, ඌවේ මහ කැරල්ල ආදී නම්වලින් ඉතිහාසයේ හඳුන්වනු ලබන බ්‍රිතාන්‍යය ආධිපත්‍යට විරුද්ධ ව උඩරට ජනතාව විසින් දියත් කරන ලද සිංහලේ ප්‍රථම නිදහස් සටනයි. ක්‍රි.ව. 1817-1818 කාලය තුළ ඌව වෙල්ලස්සෙන් ආරම්භ වී මුළු ඌව පුරා ම පමණක් නොව සබරගමුව සහ මාතලේ ආදී ප්‍රදේශවල ද ව්‍යාප්ත වූ එම සටන නීත්‍යානුකූල ව පිහිට වූ ආණ්ඩුවකට විරුද්ධ ව සිදු කරන ලද්දක් වශයෙන් සලකා ඉංග්‍රීසීන් විසින් "කැරැල්ලක් " ලෙස හැඳින්වුවත්, ඇත්ත වශයෙන් එය උඩරට බලය ලබා ගත් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධ ව කරන ලද නිදහස් සටනකි. (බණ්ඩාර, 1991: 211)

මෙලෙස ආරම්භ වී ක්‍රියාත්මක වූ ඌව වෙල්ලස්ස නිදහස් සටන් අරගලය පිළිබඳ ජන කවිය සහ ජනශ්‍රැතිය තුළ අන්තර්ගත තොරතුරු ගණනාවකි. සාහිත්‍ය මූලාශ්‍රයවල ප්‍රධාන කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණ ද ජන සාහිත්‍ය තුළින් හඳුනාගත හැකි අප්‍රකට තොරතුරු බහුල ය. එලෙස ජන කවි සහ ජනශ්‍රැතිය තුළ එන තොරතුරු පහත පරිදි ක්ෂේත්‍ර වශයෙන් විස්තර කෙරේ.

**17 වන සියවසේ ආරම්භය වනවිට ඌව වෙල්ලස්සේ පැවති තත්ත්වය**

අගනුවරින් ප්‍රත්‍යන්ත ප්‍රදේශයක් වුව ද සිංහල රාජාණ්ඩු පාලන සමයේ පටන් සශ්‍රීකව පැවති ප්‍රදේශයක් ලෙසට ඌව වෙල්ලස්ස ප්‍රදේශය හඳුනාගත හැකි ය. පුරාතනයේ පටන් අනුරාධපුර රාජධානියේ උප රාජධානිය වශයෙන් සැළකෙන රෝහණ රාජධානියට ඌව වෙල්ලස්ස අයත් ව පැවති බව මූලාශ්‍රයගත සාධක ගණනාවක් අනුව පැහැදිලි වේ. "අනුරාධපුර යුගයේ ප්‍රථම භාගයේ දී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් අයත් ව පැවති බව පෙනෙන්නේ රෝහණ රාජ්‍යයට ය." (රණවැල්ල, 2003:01) යනුවෙන් රණවැල්ල සඳහන් කරන අදහස අනුව පැහැදිලි වන්නේ ප්‍රස්තුත ප්‍රදේශය රෝහණයට අයත් භූමි භාගයක් බවයි. දුටුගැමුණු රාජ්‍ය සමයේ දී සද්ධාතිස්ස කුමරු යටතේ රට බත බුලතින් ස්වයංපෝෂිත කිරීමට දායකත්වය දුන් ආර්ථිකමය වශයෙන් සශ්‍රීක ව පැවති ප්‍රදේශයක් (මහාවංසය, 24 පරි:58 ගාථාව) ලෙසට සැළකෙන ඌව වෙල්ලස්ස ප්‍රදේශය බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් කරගන්නා සමය වනවිටත් එලෙසින් ම සශ්‍රීක ව පැවති බවට තොරතුරු ජන සාහිත්‍ය තුළ අන්තර්ගත වේ.

පර්යේෂණයට ප්‍රස්තුත මොණරාගල දිස්ත්‍රික්කයේ ස්වයංපෝෂිත භාවය උදෙසා ස්වභාවික ව පැවති කඳු හෙල්, ජල දුර්ග, ගිරි දුර්ග, භූමියේ පිහිටීම, දේශගුණය ආදී සාධක බොහෝ සෙයින් ඉවහල් වූ බව හඳුනාගත හැකි අතර එනිසා ම පෙර රජුන් දවස ග්‍රාමීය ව වාසය කළ ජනයා අතර සාමකාමිත්වය, ස්වයංපෝෂිතභාවය පිළිබඳ ගැටළු අවම විය. මෙකී පුරවරය ආශ්‍රිත ව රජුන් කළ ක්‍රියාකාරකම් හා ගැමි ජනයා භුක්ති විඳි වරප්‍රසාද පිළිබඳ ව ජන කවි ආශ්‍රයේ පහත පරිදි තොරතුරු ඇතුළත් වේ.

පෙර විරු රජුන් ඔබේ ගුණ මහිමය හින්දා
කෙත්වත් වැවුවා අපෙ කිරි බිළිඳුන් හින්දා
වතුපිටි සරි කලා සිරිලක් මව හින්දා
අපි තුටු වුණා ඔබෙ යහපත් වැඩ හින්දා

(එච්. එම්. බණ්ඩාරමැණිකා, සම්මුඛ සාකච්ඡාව, 2013)

පෙර රජුන් සිදු කළ යහපත් ක්‍රියාකාරකම් නිසා ගැමි ජනයා නිදහස සහ ස්වයංපෝෂිත භාවය භුක්ති විඳි බව ඉහත ජන කවියෙහි නිරූපිත ය. රජුන් යහපත් අනාගතයක් උදෙසා කෘෂිකාර්මික කටයුතු ආදියෙහි නිරත වීමෙන් ඊට පසු පරම්පරාව එහි සමෘද්ධිමත්භාවය අත්විඳි බව ද ඉහත ජන කවියෙන් පිළිබිඹු වේ. එම තත්ත්වය 18 වන සියවසේ ආරම්භය තෙක් කාලය දක්වා ම පැවති බව ද ජන සාහිත්‍ය තුළින් පැහැදිලි වේ.

දහස් ගණන් වැව් සහ අමුණු ද තිබුණා
ලස්ස ගණන් මහවෙල් යායක් තිබුණා
වෙල්ලස්සට ඔබිනා නම පට බැඳුණා
රන් කරලින් බරවී ගොවි හද පිරුණා

(බී. එම්. සෙනෙවිරත්න, සම්මුඛ සාකච්ඡාව,2015)

ප්‍රස්තුත ප්‍රදේශය තුළ කෙතරම් වැව් සහ අමුණු ප්‍රමාණයක් පැවතියේ ද යන්න ප්‍රමාණාත්මක ව දැක්වීමට නොහැකි ව දහස් ගණන් යනුවෙන් සඳහන් කිරීම තුළ වෙල්ලස්සේ එවකට පැවති සශ්‍රීකත්වය කෙතරම් ද යන්න හඳුනාගත හැකි ය. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමෙන් පසුව කැරැල්ල ආරම්භ වන සමය වනවිටත් වාරි තාක්ෂණය මූලික කරගෙන සිදු කෙරුණු දියුණු කෘෂි ආර්ථිකයක් මෙම ප්‍රදේශවල පැවත ඇති බව ඉන් තහවුරු වේ. ලාංකේය ගැමි, ගොවි ජනතාව සතුටින් සමාදානයෙන් කාලය ගත කළ බව ද ස්වයංපෝෂිතභාවය වෙල්ලස්ස පුරා පැතිරී පැවති බවට ද ඉහත ජනකවි සාක්ෂි දරයි. "වෙල් ලස්සයක්" තිබූ බවට යන අරුත් දෙන වෙල්ලස්සේ යනුවෙන් ප්‍රකාශ වීමෙන් වෙල්ලස්සේ විශාල ජනකායක් වාසය කළ බව ද පිළිබිඹු වේ. 1818 නිදහස් අරගලය ආරම්භයට ප්‍රථම ව ප්‍රස්තුත අධ්‍යයන ප්‍රදේශය තුළ පැවති තත්ත්වය කෙබඳු ද යන්න මේ අනුව පැහැදිලි ය.

**1818 නිදහස් අරගලයේ ආරම්භය**

ශතවර්ෂ ගණනාවක් පුරාවට යටත් කරගත නොහැකි වූ උඩරට ඉංග්‍රීසීන් විසින් යටත් කර ගන්නා ලද්දේ වගන්ති 12 කින් යුත් ගිවිසුමකට මහනුවර මඟුල් මඩුවේ දී අත්සන් තැබීම උපයෝගී කරගෙනයි. ලාංකේය සාම්ප්‍රදායික පාලන ප්‍රතිපත්ති අනුගමනය කරමින් දේශ හිතෛෂී පාලනයක් ගෙන යන බවට ගිවිසුම්ගත වෙමින් ලංකාව යටත් කර ගත්ත ද බ්‍රිතාන්‍යයන් වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ එකී ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කරමින් ඔවුන්ට අවශ්‍ය පරිදි පරිපාලන කටයුතු ගෙනයාම මත සිංහලයන් ලාංකේය පළමු නිදහස් අරගලය සඳහා පිඹුරුපත් සකස් කරන ලදී. අරගලය ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වීමට බලපාන ලද මූලික හේතු සාධකය වූයේ මඩිහ මුහන්දිරම් තනතුරට මුස්ලිම්වරයෙකු පත් කිරීම බවත්, එයින් කෝපයට පත් සිංහලයන් ඊට විරුද්ධ ව ක්‍රියාත්මක වූ ආකාරයත් මූලාශ්‍රයගත තොරතුරු අනුව පැහැදිලි වේ.

"උඩරට රාජධානි සමයේ මඩිහ ලේකම් තනතුර ප්‍රදානය කරන ලද්දේ සිංහල ප්‍රධානියෙකුට ය. නමුත් ඩොයිලිගේ චර පුරුෂ කාර්යයට සම්බන්ධ මුස්ලිම්වරු ඔහුගේ හොඳ හිත දිනා සිටියහ. මෙකී පසුබිමක මඩිහ ලේකම් තනතුර හජ්ජි මුහන්දිරම් ට ප්‍රදානය කරන ලදී. මේ පිළිබඳ ව කෝන්තියෙන් පසු වූ සිංහල ජනතාව රාජසිංහ රජුගේ නෑදෑයකු බව කියමින් සිටි දොරේ සාමි නැමති පුද්ගලයා හා එක් වෙමින් සිටියහ. දොරේ සාමි වැදි හමුදාවක් සමග වෙල්ලස්සට පැමිණි බවට ඉංග්‍රීසින්ට තොරතුරු ලැබිණි. මේ නිසා මොහු අල්ලා ගැනීමට බදුල්ලේ ඒජන්තවරයා හජ්ජි මුහන්දිරම් එවන ලදී. නමුත් හජ්ජි මුහන්දිරම්ට දොරේසාමි අල්ලා ගත නොහැකි වූ අතර කැරලිකරුවන්ගේ පහර දීමකින් හජ්ජි මුහන්දිරම් මැරී වැටුණේ ය." (ශ්‍රී ලංකාවේ ඉතිහාසය සිවුවන කොටස, 2007:36-37)

මෙම නිදහස් අරගලයේ ආරම්භය පිළිබඳ තොරතුරු ජන කවිය තුළ ද අන්තර්ගත ව ඇති ආකාරය හඳුනාගත හැකි ය.

හජ්ජි මුහන්දිරම් අල්ලාගෙන මරලා
ඌවේ පාලන විල්සන් අල්ලාලා
දුන්නෙන් විදල බිබිලේ දී මරලා
නිදහස් සටන වෙල්ලස්සෙන් දියත් කලා

(ඒ. එම්. ධර්මසේන, සම්මුඛ සාකච්ඡාව, 2013) .

ප්‍රථම නිදහස් සටනෙහි ආරම්භය පිළිබඳ ඉහත උපුටනයෙහි සහ ජනකවියෙහි තොරතුරුවල සමානතාවයක් දැකිය හැකි නිසා මූලාශ්‍රයගත තොරතුරුවල සහ ජන සාහිත්‍යාංගවල විශ්වසනීයත්වය තීව්‍ර වේ.

**1818 නිදහස් අරගලයේ මූලිකත්වය ගත් ප්‍රකට සහ අප්‍රකට චරිත**

ප්‍රථම නිදහස් අරගලයේ නායකත්වය ගත් පිරිස් පිළිබඳ තොරතුරු රාශියක් ද සාහිත්‍ය මූලාශ්‍රයවල මෙන් ම මොණරාගල ප්‍රදේශය ආශ්‍රිත ව පවතින ජන සාහිත්‍යය තුළ අන්තර්ගත ව ඇති ආකාරයක් ද හඳුනාගත හැකි ය. ලිඛිත මූලාශ්‍රයවල සඳහන් තොරතුරු අනුව සටනේ නායකත්වය ගත් ප්‍රධාන නායකයන් රැසක් පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි අතර එම ප්‍රධාන තොරතුරුවලට අමතර ව අප්‍රකට තොරතුරු ගණනාවක් ජන සාහිත්‍යයේ ඇතුළත් වේ. ප්‍රධාන නායකයන්ගේ මග පෙන්වීම අනුව ඌව වෙල්ලස්ස ප්‍රදේශවල ජනයා සිය නිදහස උදෙසා නොමඳ ව සිය දායකත්වය අරගලය උදෙසා ලබා දී ඇති ආකාරයක් හඳුනාගත හැකි ය.

කොහු කුඹුරේ රටේ රාලගේ අඩිපාරේ
බූටාවේ රටේ රාලගේ අඩිපාරේ
සැරසි සියලු ජනබල සෙන් මේ වාරේ
කැප්පෙටිපොලත් ආවා අලුපොත පාරේ

(එච්. එම්. බණ්ඩාරමැණිකා, සම්මුඛ සාකච්ඡාව,2013)

අටදාහක ලොකු හමුදාවක් රැගෙන
කාල තුවක්කුද බයිනෙත්තුද රැගෙන
කැප්පෙටිපොල ආවේ අප වනසන්න
සුද්දන් යවා ගත්තා සටනේ පෙරමුණ

(ඒ. එම්. ධර්මසේන, සම්මුඛ සාකච්ඡාව,2013)

කොහු කුඹුරේ රටේ රාල, බූටාවේ රටේ රාල ආදී දේශප්‍රේමීන් මෙම සටනේ පුරෝගාමී නායකයින් ලෙස සටන සංවිධානය කරමින් කටයුතු කර ඇති බව මෙයින් පැහැදිලි ය. නමුත් ඉංග්‍රීසින් නියෝජනය කරමින් පැමිණි කැප්පෙටිපොල නිලමේ සටන අවස්ථාවේ දී සිංහල ජනතාව සමග එක් වූ බව හඳුනාගත හැකි ය. ඒ පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන්නේ මෙලෙසිනි.

"බදුල්ලෙන් නික්මෙන විට කැරැල්ලට සහභාගි වීමේ අදහසක් නොතිබුණු නමුත් ප්‍රශංසාවට බෙහෙවින් ළැදි ඔහු කැරැල්ලේ නායකයා වීමට කැමති කරවා ගන්නට ඇත. තුවක්කු ආපසු එවීමෙන් ඔහු සෝවර්ස් මහතාට හා මේජර් මැක් ඩොනල්ඩ් ට දැක්වූයේ අපූර්ව අවංක භාවයකි." (මාර්ෂල්, 2004:162)

මේ අනුව කැප්පෙටිපොල දිසාවේගේ අවංකභාවය සහ සිංහල ජාතිය වෙනුවෙන් තිබූ ජාති මාමකත්ව හැඟීම නිරූපිත ය.

1818 කැරැල්ල ප්‍රභූ නායකත්වයෙන් නිර්ප්‍රභූ දායකත්වයෙන් ක්‍රියාත්මක වූ අරගලයක් ලෙස ද, සාමාන්‍ය ගැමි ජනයා දේශපාලනය කෙරෙහි ඍජු ව දායක වුණු අවස්ථාවක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. ඉංග්‍රීසීන් සතුව විශාල හමුදා බලයක් මෙන් ම විශාල ආයුධ බලයක් පැවත ඇති අතර සිංහල

ගැමි ජනයා සතුව පැවත ඇත්තේ කඩු, දුනු, හී වැනි අවි ආයුධ සහ සැඟවී සිට පහර දීමේ සටන් ක්‍රම ආදිය පිළිබඳ ඥානයයි. ගැමි ජනයා පාරම්පරික සටන් ක්‍රම පිළිබඳ ව පැවති දැනුම සහ ප්‍රදේශයේ භූ භෞතික ස්වභාවය උපයෝගී කර ගනිමින් තීක්ෂණ බුද්ධියෙන් ඉංග්‍රීසින් විනාශ කිරීමේ ක්‍රියාවලියේ නිරත වූ බව හඳුනාගත හැකි ය. සිංහල ජනතාව තම ආත්ම විශ්වාසය පෙරදැරි කොට ගත්, බිය සැක නැතිව දේශයේ අභිමානය වෙනුවෙන් සටන් වැදි පිරිසක් බව ද හඳුනාගත හැකි ය.

අදිරදි වාදී සුද්දන්ගේ පොරොන්දුව
කඩ කළ නිසා විරු දරුවන් එකමුතුව
කඩු දුනු අමෝරා ගෙන බිය සැක නැතිව
සටනට ගියා වෙල්ලස්සේ සේනාව

(එච්. එම්. බණ්ඩාරමැණිකා, සම්මුඛ සාකච්ඡාව,2013)

මෙලෙස සිංහලයන් ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද සටන් ව්‍යාපාරය සඳහා අනුශාසකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ ව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් නොවන තොරතුරක් මොණරාගල ප්‍රදේශයේ ජනශ්‍රැති ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. එනම් නාපේ රේවත නම් හිමිනමක් පිළිබඳ වන තොරතුරයි.

“එදා වෙල්ලස්ස හටන කාලේ යුද්දෙට හැමදේම සූදානම් කෙරුවේ පොතුබන්දන විහාරේනෙ. පන්සලේ ලොකු හාමුදුරුවො තමයි නාපේ රේවත හාමුදුරුවෝ. මේ හාමුදුරුවෝ තමයි සටනට ඕන හැම අවවාද අනුසාසනාවක් ම දුන්නේ.” (බී.ආර්. පියසේන, සම්මුඛ සාකච්ඡාව,2015)
ඉහත ජනශ්‍රැතියට අනුව පොතුබන්දන විහාරේ රේවත හාමුදුරුවෝ සටනට අවශ්‍ය සියලු ම අවවාද උපදෙස් ලබා දෙමින් සටන මෙහෙය වූ බවක් හඳුනාගත හැකි ය. ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයේ දී පුරාතනයේ සිට ම බොහෝ සංග්‍රාම අවස්ථාවන්හි දී සංඝයාගේ නොමඳ දායකත්වය ලබා ගත් බව නිරූපිත ය. රේවත හාමුදුරුවන් සහ සිංහල ජන ප්‍රධානීන් එක්ව 1818 කැරැල්ලේ කටයුතු සංවිධානය කළ බව හඳුනාගත හැකි අතර ඔවුන් යටතේ සාමාන්‍ය ගැමි ජනයා කටයුතු කළ බව ද පිළිබිඹු වේ.

බදුල්ලේ ඒජන්තවරයා ලෙස කටයුතු කළ සිල්වෙස්ටර් ඩග්ලස් විල්සන් විඳ මරා දැමීමේ කාර්යය සිදු කරන ලද්දේ හිටිරාල විසිනි. හිටිරාල යනු 1818 ඌවේ නිදහස් සටනේදී සුවිශේෂී කාර්යභාරයක් සිදු කළ අප්‍රකට විරුවෙකි. ඔහු අතිදක්ෂ දුනුවායෙකු ලෙස නම්දරා සිටි අයෙකි. ඊතනවත්ත දේවාලය අසලදී සිල්වෙස්ටර් ඩග්ලස් විල්සන් සහ ඔහුගේ භාෂා පරිවර්තකයා විඳ මරා දමන ලද්දේ හිටිරාල විසිනි.

මේ ආදී වශයෙන් ප්‍රථම නිදහස් අරගලයට නායකත්තනය දුන් ප්‍රකට මෙන් ම අප්‍රකට නායකයන් පිළිබඳ තොරතුරු ජන සාහිත්‍යය තුළ අන්තර්ගත වන අතර ඔවුන් යටතේ සාමාන්‍ය ජනයා නිදහස් අරගලය උදෙසා සහභාගී වී ඇති ආකාරය ද හඳුනාගත හැකි ය.

**නිදහස් අරගලය තුළ සිංහලයාගේ උපක්‍රමශීලී ක්‍රියා පටිපාටිය**

නිදහස උදෙසා ක්‍රියාත්මක කළ සෑම සටන් ව්‍යාපාරයක ම පුරාතනයේ පටන් දැකගත හැකි, අධ්‍යයනය කළ යුතු ම අංගයක් වන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ උපක්‍රමශීලී ක්‍රියා පිළිවෙතයි. රජරට රාජධානි සමයේ පටන් ම මෙරටට එල්ල වූ ආක්‍රමණවල පටන් ම ඉතාමත් උපක්‍රමශීලී ව සිංහලයන් කටයුතු කළ බවට මූලාශ්‍රයගත සාධක රාශියකි. 1818 නිදහස් අරගලය හමුවේ ද එම තත්ත්වය එසේ ම ක්‍රියාත්මක කළ බවට තොරතුරු ජන සාහිත්‍ය තුළින් හමු වේ. අවි ආයුධ භාවිතය මගින් යුරෝපීයයන් පරාජය කිරීමට තරම් ප්‍රමාණවත් අවි ආයුධ ශක්තියක් සිංහලයන් සතු ව නොපැවතිය ද උපක්‍රමශීලී බව අතින් ඔවුනට වඩා විශාල වශයෙන් ඉදිරියෙන් සිටි බව මොණරාගල ප්‍රදේශයේ පවතින පහත ජනශ්‍රැතිය මගින් පැහැදිලි වේ.

"උන්දෑ වෙලේ වැඩ කර කර හිටිය මිනිහෙකුට අඬ ගහලා කිව්වා "උඹ ගිහිල්ලා මං අල්ලන්න ඇවිත් ඉන්න සුද්දන්ට ඔත්තුව දීපං මං කුඹුරේ තණ කොළ ගලවනවා කියලා." ඒ මිනිහට සේරම තේරුණා. මිනිහා ඉතිං ගිහින් දුන්නා ඔත්තුව. ඉතිං සුද්දෝ ආවා ඉගිල්ලිලා. ආව ගමන් මොනා වෙන්න ද ඉතිං. මුත්තා හිටියේ උල්පත ලියද්දේ අයිනට ම වෙලා. මුත්තා ළඟට එන්න හදන හදන එකා එරිලම මැරිලා ගියා. උන්ගේ මිනීවත් දකින්න නෑ...." (ජේ.එම්. පේමාවතී, සම්මුඛ සාකච්ඡාව, 2015)

මේ ආකාරයට අවිආයුධ ශක්තිය අතින් ඉංග්‍රීසි ජාතිකයන් තරම් දියුණු මට්ටමක නොසිටි සිංහලයන් ඉංග්‍රීසීන්ට නුපුරුදු ලංකාවේ පැවති ස්වාභාවික භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින් උපායශීලී ව කටයුතු කළ අවස්ථා රැසක් පිළිබඳ තොරතුරු හමු වේ. මීට අමතර ව සිංහලයන්ගේ උපක්‍රමශීලී බව කියැවෙන අවස්ථා ගණනාවක් මොණරාගල ජනශ්‍රැති තුළ හමු වේ.

"සුද්දෝ එන අඩි පාරවල් දිගේ අටවනවා දුනු. දුන්නට ඊතලේ දාලා පේන්නේ නැති වෙන්න ගැට ගහනවා ගහක. ලණුව තියෙන්නේ බිමනේ. බිම දිගේ එන සුද්දොන්ට මරු වැළ පැගුණ ගමන් කෙලින්ම ඊතලේ ගිහිං පපුවේ. ආයේ ඉතිං මොන කතාද. උන් එතනම. තැනින් තැන දුනු ඊතල දහය විස්ස මානනවා. ඒ ගානට පර සුද්දෝ බිම දානවා." (ජේ.එම්. පේමාවතී, සම්මුඛ සාකච්ඡාව,2015)

"සුද්දෝ ගම්වලට කඩා වදින කොට ගස් කපා දාලා උන්ව මරා දානවා. පාරවල් අවහිර කොරලා ගස් කපලා උන් එනකං අපේ මුත්තා බලන් ඉන්නවා. ඊට පස්සේ අර ගස් කදන් අතහරිනවා. ආයේ ඉතිං මහ ගහක් කඩං වැටුනම වෙන දේ මොනා ඉතිං." (එම)

"රටේ රාල මුත්තා සුද්දෝ මැරුවේ එකේක තාලෙටනේ. ඔන්න උන්දැ කොරපු තව වැඩක් තමයි උගුල් අටවපු එක. කොහොමද දන්නවද උගුල් අටවන්නේ මී මිණි වර අරගෙන ඒ කියන්නේ මී මින්නන්ගේ හම්වලින් අඹරන කඹ. ඒ කාලේ අපේ මුත්තලා රටේ රාල මුත්තට එමටම මී මින්නන්ගේ හම් ගෙනලා දුන්නලු. මේ කඹවලින් මදු ගැට ගහනවා. මද්දට ඇටවුම් කෝටු අටවලා කොළ අතු දාලා වහනවා. සුද්දෝ ඕවා දන්නවා ඇයි ආව ගමන් අහු වෙනවා මද්දට." (එම)

මේ ආදී වශයෙන් දුනු - ඊතල ඇටවීම, ගමන් මාර්ග අවහිර කිරීම, උගුල් ඇටවීම වැනි විවිධ උපක්‍රම රාශියක් 1818 නිදහස් අරගලයේ දී සිංහලයන් විසින් අනුගමනය කර ඇති ආකාරය ජනශ්‍රැති ඇසුරින් හඳුනාගත හැකි ය.

**නිදහස් අරගල සමයේ (16 - 17 සියවස්වල) ඌව වෙල්ලස්ස ජනතාවට මුහුණ දීමට සිදු වූ තාඩන පීඩන**

බ්‍රිතාන්‍ය පාලනය මෙරට ආරම්භ වූ යුගයේ පටන් ම ඔවුන් සිය අවශ්‍යතා ඉටු කර ගැනීම වෙනුවෙන් මෙරට ජනයා තලා පෙලා කටයුතු කළ ආකාරය පිළිබඳ ව මූලාශ්‍රයගත තොරතුරු රාශියකි. සමස්ත ලංකාව ම සිය ආධිපත්‍යයට යටත් කර ගැනීමෙන් පසුව ද එම තත්ත්වය තවදුරටත් වර්ධනය වීමක් මිස අවම වීමක් සිදු නොවූ ආකාරය හඳුනාගත හැකි ය. උඩරටියන් සහ ඉංග්‍රීසීන් අතර මුල් කාලයේ පටන් ම කිසිදු සුහදත්වයක් නොවූ බව මාර්ෂල් සඳහන් කරනු ලබන්නේ මෙලෙසිනි.

"හැම පන්තියකට ම අයත් උඩරටියෝ නොයෙක් කරුණු නිසා ඉංග්‍රීසින් අප්‍රිය කරති. ජාතිය, භාෂාව, ආගම, චාරිත්‍ර වාරිත්‍ර, ගති පැවතුම් හා සිතුම් පැතුම් අතින් තමන්ට අසමාන බ්‍රිතාන්‍ය පාලනය දිගු කලක් යන තෙක් ඔවුනට අරුචි වීම නො වැළැක්විය හැක්කකි. පැරණි රජය යටතේ නිලමේවරු දුප්පත් පංතිවලට අනුග්‍රහය දැක්වූහ.' යි සැලකිණි. ඉංග්‍රීසින් හා විවිධ වර්ගවලට අයත් උඩරටියන් අතරේ සානුකම්පිත හැඟීමක් සුහද සමාජ හැඟීමක් නොවී ය."(මාර්ෂල්, 2004: 14)

මෙලෙස එකිනෙකා නුරුස්සන පසුබිමක් ආරම්භයේ පටන් ම වර්ධනය වීම තුළ බලය සියතට ගැනීමෙන් පසු විවිධාකාරයෙන් සිංහලයන් පීඩාවට පත් කිරීම ඉංග්‍රීසීන් විසින් සිදු කරන්නට ඇතැයි පැහැදිලිව ම උපකල්පනය කළ හැකි ය. සිය පාලනයට විරුද්ධ ව ලාංකිකයන් නැගී සිටීම තුළ මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වන්නට ඇත. විශේෂයෙන් ම සටන තරමක් ප්‍රබල ව ව්‍යාප්ත වී යාමත් සමග ඉංග්‍රීසීන්ට එල්ල වූ බලපෑම තුළ එම තත්ත්වය තවදුරටත් වර්ධනය වූ බව බණ්ඩාර සඳහන් කරන තොරතුරු අනුව පැහැදිලි ය.

"බ්‍රිතාන්‍යයන්ට ඌව හා වෙල්ලස්ස කඳවුරු සියල්ල අත්හැර දැමීමට සිදු වූ අතර සටන් කරුවන්ගේ තදබල පහරදීම්වලට ලක් වෙමින් සිටි ඔවුන්ගේ සේනාංකවලට ආහාර පාන හිඟ විය. එයින් වියරු වැටුණු ඔවුහු උඩරට ප්‍රදේශවල ආහාර පාන, හරකබාන කොල්ල කෑ අතර ගේ දොර වතුපිටි ඉඩකඩම් ගිනි තබා විනාශ කලහ." (බණ්ඩාර, 2018: 16-17)

මෙමගින් පැහැදිලි වන්නේ 1818 නිදහස් අරගලයත් සමග එය ක්‍රියාත්මක වූ ප්‍රදේශවල පමණක් නොව අනෙකුත් ප්‍රදේශවල සිටි සාමාන්‍ය ජනතාව පවා පීඩාවට පත් කරමින් ඉංග්‍රීසීන් කටයුතු කළ බවයි. විශේෂයෙන් ම තමාට විරුද්ධ ව අරගලය ක්‍රියාත්මක වූ ප්‍රදේශවල සිටි වැසියන් විශාල වශයෙන් පීඩාවට පත් කිරීම ඉංග්‍රීසීන් විසින් සිදු කළ බවට තොරතුරු ලැබේ. ඒ බව සටන ක්‍රියාත්මක වූ ප්‍රදේශයක් වන මොණරාගල දිස්ත්‍රික්කයේ ජන සාහිත්‍යය තුළ සඳහන් තොරතුරු අනුව මනාව පැහැදිලි වේ.

අපි දුටු රජෙක් නැත
පිළිපදින්න රජ අනකුත් නැත
සුදු මහතුන්ගේ සොඳ නීතියද නැත
ගන්න කිසිවක් කුසට දැන් නැත

(ආර්.ඒ. බේබිනෝනා, සම්මුඛ සාකච්ඡාව,2015)

රාජාණ්ඩු පාලනය යටතේ පාලනය වූ මෙම ප්‍රදේශ මුල් කාලයේ සිට ම ඉතාමත් සශ්‍රීක ව පැවති ප්‍රදේශ බව අනුරාධපුර රාජධානි සමයේ පටන් පවතින මූලාශ්‍රයගත සාධක අනුව පැහැදිලි වේ. නමුත් එම තත්ත්වය ඉංග්‍රිසි පාලන සමය තුළ වෙනස් වී ඇති ආකාරයක් උද්දීපනය වේ. පාරම්පරිකව පැවත ආ මෙකී සාමකාමී පරිසරයෙන් මිදී කෲර පාලනයකට මුහුණ දීමට ගැමි ජනයාට සිදු වූයේ ඉංග්‍රිසි පාලනයත් සමග ය. නිදහස් අරගල සමයේ මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය වන්නට ඇත.

භාෂාව භාවිතය සම්බන්ධයෙන් ද මෙම කාලයේ දී සිංහල ගැමියන් දුෂ්කරතා රැසකට මුහුණ දුන් ආකාරය ජන කවිය තුළ එන තොරතුරුවලින් ගම්‍ය වේ. අධ්‍යාපන එතරම් උසස් මට්ටමක නොපැවති කාල සීමාවක් වන මෙම කාලයේ දී ඉංග්‍රීසි භාෂාව උගත් පිරිස සිටියේ සුළු වශයෙනි. ඔවුන් අතර වූයේ ද උඩරට රදල පිරිසයි. සාමාන්‍ය ගැමි ජනයා භාවිත කරන ලද්දේ තම ප්‍රදේශයට ආවේණික භාෂාවකි. අතීතයේ සිට මොණරාගල ගැමි ජනයා ද ඔවුනට ආවේණික පරිසරයට අනුකූල වූ සිංහල භාෂාවක් හැසිරවීමට පුරුදු පුහුණු වී සිටි බව හඳුනාගත හැකි ය. නමුත් ඉංග්‍රීසි පාලන සමයේ දී ඔවුනගේ භාෂාව නොදත් ගැමි ජනයා ඉන් ලද පීඩනය පිළිබඳ ව තොරතුරු ජනකවි ආශ්‍රයේ පවතී.

සුන්දර ගුණ වඩන ඉංග්‍රිසි මහතුන්ගේ  
උස්කර තිබෙන නම්ගම් නැත තේරෙන්නේ  
ගම්භිර බසින්මයි ඉංග්‍රිසි දොඩවන්නේ  
සැන්සර් එකේ දොර අතනයි පෙනෙන්නේ

(ආර්.ඒ. බේබිනෝනා, සම්මුඛ සාකච්ඡාව, 2015)

භාෂාමය ගැටලු හේතුවෙන් ගැමියා ඉංග්‍රීසින් ඉදිරියේ අසරණයෙකු ලෙස කටයුතු කළ බව සහ භාෂාව පිළිබඳ පැන නැගි අර්බුධකාරීමය තත්ත්වය මෙමගින් හඳුනාගත හැකි ය.

ඉංග්‍රීසි පාලනයට විරුද්ධ ව සිංහලයන් නැගී සිටීම මර්දනය කිරීමට අපහසු තත්ත්වයක් ලෙස ප්‍රදේශ ගණනාවක ව්‍යාප්ත ව යාම හේතුවෙන් එම තත්ත්වය මර්දනය කිරීමට ඉංග්‍රීසීන් අනුගමනය කළ ප්‍රතිපත්තිය වූයේ යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීමයි. එම තත්ත්වය තුළ ලංකාවේ බොහෝ ප්‍රදේශවල වැසියන් පීඩාවට පත් වූ ආකාරය ඩේවි සඳහන් කරන්නේ මෙලෙසිනි.

"යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් ලත් බලය සියතට ගත් හටයින් එය මර්ධනය කිරීමේ පහසු මඟක් වශයෙන් ගම්බිම් ගිනිතබා විනාශයට පත් කළහ. කුඹුරු ඇළ වේලි විනාශ කර එල දරන ගස් කපා බිම හෙළා වැසියන් බියට පත් කරමින් සාගින්නේ තබමින් අත්තනෝමතික ලෙස කටයුතු කළහ. අවි ආයුධ අත දරා සිටි මිනිසුන් දුටු තැන වෙඩි තබා මැරීමේ නිදහස සිත්සේ ක්‍රියාවට නැංවූහ." (ඩේවි, 2008:17)

මෙම තත්ත්වය ප්‍රස්තුත අධ්‍යයන ප්‍රදේශය තුළ ද ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වී ඇති බව ජන සාහිත්‍ය තුළ එන තොරතුරු අනුව පැහැදිලි වේ.

හැම ගමකටම සුද්දන් මුරකා දාලා

අහුවුන පිරිමි දරුවන් ටික කඩු ගාලා

රන් කරලින් බර වුණු කෙත් ගිනි කියලා

ගේ දොර හරක බාන ද වන සාලා

(ඒ.ඩී. දිසානායක, සම්මුඛ සාකච්ඡාව,2016)

හු හඬ ඇසුනාම ඇසිපිය ඇසිල්ලේ

වාඩිය දමා පැනපව් පඳුරු පල්ලේ

රෑනේ එවුන් එක එක අල්ල එල්ලේ

ඇදපව් දුන්න යන්නට මරු තුරුල්ලේ

(ඒ.එම්. ධර්මසේන, සම්මුඛ සාකච්ඡාව,2013)

මෙම ජන කවි ද්විත්වයෙන් ම පැහැදිලි වන්නේ ඉංග්‍රීසි පාලන සමයේ මෙරට ජනයා කෙතරම් පීඩාකාරී දිවියක් ගත කළේ ද යන්නයි. නිදහස්, සාමකාමී ජීවිතයක් ගත කළ ගැමියන්ට ඉංග්‍රීසි ප්‍රතිපත්තිවලට යටත් ව කටයුතු කිරීමට සිදුවීමෙන් සිය නිදහස අහිමි වීම ම ඉමහත් පීඩාකාරී තත්ත්වයකි. සිය ජීවිතය කුමන මොහොතක අවසන් වේ ද යන්න පිළිබඳ බියෙන් ගත කිරීමට බාල - මහලු භේදයකින් තොරව සිංහලයන්ට සිදුව පැවත ඇත. ඒ බව පහත ජනශ්‍රැතිය සාක්ෂි සපයයි.

"දකින දකින තැන ඉන්න මිනිස්සු බල්ලෝ බළල්ලු වගේ මරල දැම්මා. ගෙවල් දොරවල් එහෙම් පිටින් ම විනාශ කෙරුවා ගිනි තියලම. කොටින්ම කියනවානම් ඒ දවස්වල මේ හැම තැනම අමු සොහොන්නෙ." (ජේ.එම්. පේමාවතී, සම්මුඛ සාකච්ඡාව,2015)

එමෙන්ම ඉංග්‍රීසීන් සිය බලය අත්තනෝමතික ව භාවිත කිරීම තුළ ද සිංහල ගැමියන්ට විවිධ අවස්ථාවල පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වූ බවට තොරතුරු ලැබේ.

"…..අද කාලේ වාගේ ඉතිං ඒ කාලේ පාරවල් මේ තරං හොඳට තිබ්බේ නැනේ. මුන්නැහෙ කෙටි පාරක් අල්ලලා ගිහිං තියෙනවා හාමාපොළට යන්ඩ. කඳුරක් මැදින් යනකොට ම මේ අස්සෙයා මඬේ එරිලා වැටිච්ච. මේක දැකලා තියෙනවා මුත්තෙක්. මං වැටුනේ තෝ හිංදා තමයි කියලා, ඒජන්තෙයා මුත්තට හොඳටම තඩිබෑවා. මුත්තා ඉතිං මේ අවනඩු කාට කියන්නද…" (බී.ආර්. පියසේන, සම්මුඛ සාකච්ඡාව, 2015)

තමාට සිදු වන අසාධාරණකම් උදෙසා සාධාරණයක් ඉටු කර ගැනීමටවත් අවස්ථාවක් නොලද ගැමියන් අතිශය පීඩාකාරී ජීවිතයක් මෙකල දී ගත කළ බව මේ අනුව පැහැදිලි ය. ඉංග්‍රීසීන් යටතේ තවත් පීඩාවට පත් වූ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන්නේ කුටුම්භ ජීවිතයයි. ඉංග්‍රීසීන් හඳුන්වා දුන් මධ්‍යසාර මෙම තත්ත්වයට මූලික හේතුව විය.

ඉංග්‍රිසි මහතුනේ ඇයි රට වනසන්නේ
උන්දැයි මායි හිටියේ අපි සතුටින්නේ
වෙරි මරගාතේ දැන් එන්නේ දොඩවන්නේ
ඇස්ගෙඩි දෙකක් ලොවිගෙඩි වගෙ පෙනෙන්නේ

(එච්.එම්. බණ්ඩාරමැණිකා, සම්මුඛ සාකච්ඡාව,2013)

සිංහල කාන්තාවගේ අතීත කුටුම්භ රක්ෂණය තුළ ඉංග්‍රීසි පාලනය හමුවේ හටගත් ආරවුල් පිළිබඳ තොරතුරු මෙම ජන කවිය විදහා පායි. මෙම තොරතුරුවලට අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ සාමාන්‍යය ගැමි කාන්තාවගේ සාමකාමී දිවි පෙවෙතට එල්ල වූ තර්ජන පිළිබඳ හඳුනාගත හැකි ය. ඉංග්‍රීසි පාලන සමය නිසා මෙරට තුළ ව්‍යාප්ත වූ මත්පැන් පානය ගැමි ජනයාට පීඩනයක් විය. ඉංග්‍රීසි පාලනය මෙරට ව්‍යාප්ත වීමට ද මෙකී කාරණාව බලපෑ බව මූලාශ්‍රගත තොරතුරුවලට අනුව හඳුනාගත හැකි ය.

වෙල්ලස්ස නිදහස් අරගලය ක්‍රියාත්මක වූ සමයේ සිය අවශ්‍යතා වෙනුවෙන් කාන්තා - පිරිමි භේදයකින් තොරව සිංහල ජනයා පීඩාවට පත් කිරීම ඉංග්‍රීසීන් විසින් සිදු කර ඇති ආකාරය ද ජන කවිය තුළ එන තොරතුරු මගින් පැහැදිලි වේ.

හාමාපොළ දුරයගෙ අම්මා
හාමාපොළ රංකිරි නම් වූ අම්මා
කොතරම් කසපහර දුන්නත් අම්මා
පාවා දුන්නේ නෑ අපේ රට අම්මා

(යූ.එල්. බෙබිනෝනා, සම්මුඛ සාකච්ඡාව,2013)

ඉංග්‍රීසි ජාතිකයින් 1818 සටනට සම්බන්ධ සිංහල කැරලිකරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හාමාපොළ රංකිරි නම් කාන්තාවගෙන් ප්‍රශ්න කළ ද ඇය විසින් කිසිදු පිළිතුරක් නොදී වද වේදනා විඳ දරා ගනිමින් සටනට දායකත්වය දුන් බව නිරූපිත ය.

මේ ආදී වශයෙන් ඉංග්‍රීසීන් විසින් මෙම අරගල කාල සීමාවේ දී මෙන් ම ඊට පෙර කාලය තුළ ද අනුගමනය කරන ලද අත්තනෝමතික ක්‍රියා කලාපය හේතුවෙන් සිංහලයන් විශාල වශයෙන් පීඩාවට පත් ව සිටි ආකාරය ජන සාහිත්‍ය තුළ එන තොරතුරු මගින් මනාව ගම්‍ය වේ.

**බ්‍රිතාන්‍යයන් සටන මර්දනයට අනුගමනය කළ මර්දනකාරී ක්‍රියා පිළිවෙත**

ඉංග්‍රීසීන්ගේ අත්තනෝමතික පරිපාලනයට විරුද්ධ ව සිංහලයන් විසින් ස්ථාන කිහිපයක ආරම්භ කර ව්‍යාප්ත කරන ලද පළමු නිදහස් අරගලය අවසන් වූයේ සිංහලයන්ට අයහපත් ප්‍රතිඵල අත්කර දෙමිනි. එහිදී ඉංග්‍රීසීන් විසින් ඉතාමත් කෲර ආකාරයෙන් අමානුෂික මර්දනකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද බවට තොරතුරු ලැබේ. සටන මර්දනය උදෙසා යුද්ධ නීතිය උපයෝගී කරගත් ඉංග්‍රීසීන් එම බලය අවභාවිත කරමින් කටයුතු කළ බව මූලාශ්‍රයගත තොරතුරු අනුව පැහැදිලි ය.

"යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් ලත් බලය සියතට ගත් හටයින් එය මර්ධනය කිරීමේ පහසු මගක් වශයෙන් ගම්බිම් ගිනිතබා විනාශයට පත් කළහ. කුඹුරු ඇළ වේලි විනාශ කර එල දරන ගස්කපා බිම හෙළා වැසියන් බියට පත් කරමින් සාගින්නේ තබමින් අත්තනෝමතික ලෙස කටයුතු කළහ. අවි ආයුධ අත දරා සිටි මිනිසුන් දුටු තැන වෙඩි තබා මැරීමේ නිදහස සිත්සේ ක්‍රියාවට නැංවූහ" (ඩේවි, 2008: 17)

වර්ෂ 1818 සැප්තැම්බර් 21 දින සිට උඩරට පුරා යුධ නීතිය ප්‍රකාශයට පත් කළ අතර සටනට සහභාගී වී සිටි පිරිස් වෙත යටත් වීමට කාලයක් ලබා දෙන ලදී. පසුව බොහෝ සටන්කරුවෝ සිංහල යුද පෙරමුණ අත්හැර ඉංග්‍රීසීන් වෙත පැමිණියහ.

මෙම තත්ත්වය මොණරාගල දිස්ත්‍රික්කය තුළ ද එලෙසින් ම ක්‍රියාත්මක වී ඇති ආකාරය ජන සාහිත්‍යය තුළ හමු වන තොරතුරු අනුව පැහැදිලි වේ.

"දකින දකින තැන ඉන්න මිනිස්සු බල්ලෝ බළල්ලු වගේ මරල දැම්මා. ගෙවල් දොරවල් එහෙම් පිටින් ම විනාශ කෙරුවා ගිනි තියලම. කොටින්ම කියනවානම් ඒ දවස්වල මේ හැම තැනම අමු සොහොන්නෙ." (ජේ.එම්. පේමාවතී, සම්මුඛ සාකච්ඡාව,2015)

ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ මිනිස් ජීවිත බාල - මහලු භේදයකින් තොරව විනාශ කළ ආකාරයත්, විශේෂයෙන් ම ඉතාමත් සශ්‍රීක ව පැවති ගැමියන්ගේ කුඹුරු සහ හේන් ආදියත් විනාශ කරමින් ඉංග්‍රීසීන් කටයුතු කළ බව සඳහන් වේ.

හැම ගමකටම සුද්දන් මුරකා දාලා
අහුවුන පිරිමි දරුවන් ටික කඩු ගාලා
රන් කරලින් බර වුණු කෙත් ගිනි කියලා
ගේ දොර හරක බාන ද වන සාලා

(ඒ.ඩී. දිසානායක, සම්මුඛ සාකච්ඡාව,2016)

මිනිස් ජීවිත පමණක් නොව ජනයාගේ සශ්‍රීක අටුකොටු, කෙත් යායවල්, හේන්, හරක - බාන ආදිය මෙන් ම පුරාතන රජ දරුවන් විසින් ඉදි කරන ලද වැව් අමුණු ආදිය පවා විනාශ කරමින් ඉංග්‍රීසීන් ඉතාමත් කෲර මර්දනයක් සිදු කළ බව ජන සාහිත්‍ය අනුව පැහැදිලි ය.

අම්මගෙ තුරුල්ලේ කිරි බිව් කිරි දරුවෝ
සුද්දගෙ කඩමුනේ අමුනාලා මැරුවෝ
ජය ගන්නට බැරි හින්දා මිනි මැරුවෝ
වෙල්ලස්සට ගිනි තියලා වැනසුවෝ

(ඒ.ඩී. දිසානායක, සම්මුඛ සාකච්ඡාව,2016)

ජලයෙන් පිරුණු මහ වැව් සේරම කැඩුවා

කෙත් යායවල් ගිනි තියමින් වැනසුවා

විරුවන් මරමරා මළ මිනි ගොඩ ගැසුවා

දෝංකාර දී කඳු හෙල් දුක් වූවා

(එන්.එම්. කුමාරිහාමි, සම්මුඛ සාකච්ඡාව,2016)

මේ ආදී වශයෙන් ඌව වෙල්ලස්ස නිදහස් අරගලය හමුවේ ඉංග්‍රීසීන් අනුගමනය කරන ලද මර්දනකාරී ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි ය.

## සමාලෝචනය

ලංකාවේ පළමු නිදහස් අරගලය ලෙසට ඉතිහාසයේ සඳහන් වන ඌව වෙල්ලස්ස නිදහස් අරගලය හෙවත් 1818 නිදහස් අරගලය පිළිබඳ මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින ජන කවි සහ ජනශ්‍රැතිවල පවතින තොරතුරු පිළිබඳ විමසා බැලීමක් මෙම අධ්‍යයනයෙන් සිදු විය. “1818 නිදහස් අරගලය පිළිබඳව ජන සාහිත්‍ය තුළ එන තොරතුරු කෙබඳු ද?” යන සරල පැනයට පිළිතුරු ලබාදීමට මෙහිලා අප උත්සාහ ගන්නා ලදී. 1818 නිදහස් අරගලය පිළිබඳ ප්‍රකට තොරතුරු කෙරෙහි පමණක් පූර්ව අධ්‍යයනයන්වල දී වැඩි අවධානයක් යොමු ව තිබුණ ද එලෙස අවධානයට ලක් නොවූ අප්‍රකට තොරතුරු ගණනාවක් මෙම අධ්‍යයනය හරහා හඳුනාගත හැකි විය. ලිඛිත ඉතිහාසය තුළ බොහෝදුරට අවධානයට ලක් වන්නේ ප්‍රධාන මෙන් ම ප්‍රභූ ඉතිහාස තොරතුරුවලට පමණක් වීම තුළ ප්‍රධාන ඉතිහාස ධාරාවෙන් ගිලිහී ගොස් ඇති කරුණු ගණනාවක් කෙරෙහි මෙකී අධ්‍යයනයෙන් කරුණු අනාවරණය කෙරිණි. විශේෂයෙන් ම 1818 නිදහස් අරගලය ක්‍රියාත්මක වූ ප්‍රදේශයක් වන මොණරාගල දිස්ත්‍රික්කය ආශ්‍රිත ජන කවි සහ ජනශ්‍රැති තුළ එන අරගලය හා බැඳුණු නිර්ප්‍රභූ ඉතිහාස කරුණු ගණනාවකි. ක්‍රි.ව. 1815 දී වගන්ති ගණනාවක් සහිත ගිවිසුමකට අත්සන් තබමින් සමස්ත ලංකාවේ ම පාලන බලය සියතට ගත් ඉංග්‍රීසීන් එම ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කරමින් පරිපාලන කටයුතු සිදු කිරීමේ ප්‍රතිඵලය වන්නේ වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ නිදහස් අරගලයක් ලෙසින් ජනතා විරෝධය ඉස්මතු වීමයි. ප්‍රධාන පරිපාලන නගරවලින් දුරබැහැර අත්‍යන්ත ප්‍රදේශයක් මුල් කරගෙන වර්ධනය වූ මෙම අරගලය පිළිබඳ ලිඛිත ඉතිහාසයේ සඳහන් මෙන් ම ලිඛිත ඉතිහාසයේ සඳහන් නොවන තොරතුරු රාශියකි. ජන සාහිත්‍ය තුළ නිරූපණය වන 1818 නිදහස් අරගලය පිළිබඳ තොරතුරු සාකච්ඡා කළ හැකි ක්ෂේත්‍ර ගණනාවකි. දේශීය පාලන සමයේ පටන් ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ සශ්‍රීක තත්ත්වය පැවති ඉංග්‍රීසි පාලන සමයේ ගිලිහී ගිය ආකාරය මෙන් ම නිදහස් සටනක් ආරම්භ කිරීම කෙරෙහි සිංහලයන් යොමුවීමට බලපෑ මඩිහේ මුහන්දිරම් තනතුරට මුස්ලිම්වරයෙකු පත් කිරීම පිළිබඳව ද තොරතුරු ද ජන සාහිත්‍යයේ හමු වේ. එමෙන් ම නිදහස් සටනේ මූලිකත්වය ගත් ප්‍රධාන පුද්ගලයන්ට අමතර ව ප්‍රස්තුත ප්‍රදේශයේ අප්‍රකට චරිත විසින් අරගලය වෙනුවෙන් සිදු කළ කැපකිරීම් පිළිබඳ තොරතුරු ද ජන සාහිත්‍යයේ බහුල ය. එමෙන් ම අවි ආයුධ ශක්තියෙන් ඉංග්‍රීසීන් තරම් දියුණු මට්ටමක නොසිටි සිංහලයන් විසින් උපක්‍රමශීලීව කටයුතු කර ඇති බව පැහැදිලි වේ. 16 - 17 සියවස්වල එනම් නිදහස් අරගලයට ආසන්න සමයේ මෙන් ම 1818 නිදහස් අරගල සමයේ සාමාන්‍ය ජනතාව ගත කළ පීඩාකාරී ජීවිතය පිළිබඳ මෙන් ම ඉංග්‍රීසීන් අරගලය මර්දනය කිරීමට අනුගමනය

කළ කෘෂර ප්‍රතිපත්ති පිළිබඳව ද අධ්‍යයනය හරහා ජන සාහිත්‍යය තුළ සඳහන් තොරතුරු හඳුනාගත හැකි විය. ප්‍රධාන ඉතිහාස ධාරාව තුළ සඳහන් නොවන තොරතුරු ගණනාවක් ජන සාහිත්‍යය තුළ අන්තර්ගත බව යථෝක්ත තොරතුරු විශ්ලේෂණයෙන් පැහැදිලි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර

*ධාතුවංශය* (1924). සංස්කරණය, දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර හිමි, සේරුවිල මංගල රජමහා විහාරය.

*ධාතුවංශය* (1961). සංස්කරණය, දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර හිමි, සේරුවිල මංගල රජමහා විහාරය.

*පූජාවලිය* (1951). සංස්කරණය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*මහාවංශය* (1922). සිංහල පරිවර්තනය, පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි හා ඩී.ඒ.ද. එස් බටුවන්තුඩාවේ, කොළඹ: රත්නාකර පොත්හල.

*මහාවංශය* (1996). ප්‍රථම භාගය, පරිවර්තනය, හික්කඩුවේ සිරි සුමංගල හිමි, කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

*මහාවංශය දෙවන කොටස* (2000). හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමන්, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

### ද්විතියික මූලාශ්‍ර

අභයවර්ධන., එච්. ඒ. පී., 1978. *කඩයිම් පොත් විමර්ශනය*, කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

අමරසේකර., දයා, 1996. *ජනකවිය සහ ගැමි සමාජය*, වරකපොළ: ආරිය ප්‍රකාශකයෝ.

අමරසේකර., ධර්මබන්දු, 1992. *ඓතිහාසික ජනකතා*, කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

අල්විස්, ප්‍රේමචන්ද්‍ර., 2004. නොක්ස් දුටු ලක්දිව, කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

අස්සජි හිමි, තල්පේ., 1998. *ජනකවිය දෙවියෝ සහ යක්ෂයෝ*, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඇඳගම, පණ්ඩුල., 1986. *මානව විද්‍යාව හා ශ්‍රී ලංකාව*, කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

එල්ලාවල, එච්., 1962. *පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය*, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

එල්ලාවල, හේම., 1964. *පුරාතන ලංකාවේ සංස්කෘතික ඉතිහාසය*, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කහඳගමගේ , පියසේන., 1994. *බින්තැන්නේ ජනකවි*, කොට්ටාව : පන්හිඳ ප්‍රකාශන.

කහඳගමගේ, පියසේන., 2002. *ජනශ්‍රැතිය හා ජනතාව*, කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, සන්ධ්‍යා., 2008. *ගොවි බස*, මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

කුමාර, එන්. වී. ජී. ඒ. හේමන්ත., 2006. *ශ්‍රී ලංකා සමාජය පිළිබඳ විමසුමකි*, කර්තෘ ප්‍රකාශයකි.

ගුණවර්ධන, රණවීර ලෙස්ලි., 2005. *ඉතිහාසයේ අතීතය*, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණසේකර, බන්දුසේන., 2001. *ජනශ්‍රැතිය හා ජන කතා*, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඩේවි, ජෝන්., (පරිවර්තනය, එච්. එම්. ඇහැලේපොල සෝමරත්න), 2002. *ඩේවි දුටු ලංකාව* බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

ඩේවි, ජෝන්., (පරිවර්තනය, යසපාල වනසිංහ), 2008. *ඩේවි දුටු උඩරට රාජ්‍යය සහ එහි වැසියෝ*, නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

ඩොයිලි, ජෝන්., (පරිවර්තනය, එච්. එම්. ඇහැලේපොල සෝමරත්න), 2005. *සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන්,* බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

නොක්ස්, රොබට්., (පරිවර්තනය, ඩේවිඩ් කරුණාරත්න), 1962. *එදා හෙළදිව*, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පවෙල්, ජෙයාෆ්., 2009, *කන්ද උඩරට සටන්* (පරි: ප්‍රේමචන්ද්‍ර අල්විස්), කොළඹ: සූරිය ප්‍රකාශයෝ.

පීරිස් , රැල්ෆ්., 2001. *සිංහල සමාජ සංවිධානය මහනුවර යුගය*, බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශනයකි.

බණ්ඩාර, දර්ශන., කුලතිලක, ප්‍රගීත්., 2018. Proceedings of the National Archaologycal Symposium "ක්‍රි. ව 1818 ජාතික විමුක්ති ව්‍යාපාරයේ යුධමය වාතාවරණය හා සබැඳි ඌවේ පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳව විමර්ශනයක්", කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බණ්ඩාර වි. වා. මු. තිලකසිරි., 1991. සංස්කරණය, *ඌව වංශ කතාව (I කාණ්ඩය)*, ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

බණ්ඩාර වි.වා.මු. තිලකසිරි., 1991. සංස්කරණය, *ඌව වංශ කතාව (II කාණ්ඩය)*, ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.

රණවැල්ල, සිරිමල්., 2003. *රෝහණ රාජ්‍යයේ ඉතිහාසය*, රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකි.

විජේසිංහ, පීටර්., 1986. *ඌවේ ජනකවි*, කොළඹ: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

විමලානන්ද හිමි, තෙසනකෝණ., 1962. *උඩරට මහ කැරැල්ල (දෙවැනි කණ්ඩායම)*, කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය I, II කාණ්ඩ*, 1964. කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

*ශ්‍රී ලංකාවේ ඉතිහාසය, පළමුවන කොටස,* 2009. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*ශ්‍රී ලංකාවේ ඉතිහාසය, තුන් වන කොටස,* 2007. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*ශ්‍රී ලංකාවේ ඉතිහාසය, සිවු වන කොටස,* 2007. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**දත්ත දායක නාමාවලිය**

ඒ.ඩී. දිසානායක, අවු 73. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. ගොවිතැන, සම්මුඛ සාකච්ඡාව, සන්වින්, කරගස්කදුර, බඩල්කුඹුර. 2016.11.08

ඒ. එම්. ධර්මසේන, අවු 78. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. පාරම්පරික ජන නැටුම් කලා කරුවෙකි, සම්මුඛ සාකච්ඡාව, තුන්තන, මඩුකොටන් අරාව, බඩල්කුඹුර. 2013.07.22

බී. එම්. සෙනවිරත්න, අවු 62. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. නක්ෂත්‍රකරුවෙකි, සම්මුඛ සාකච්ඡාව, මඩකලපුව පාර, අඹගොල්ල, බිබිල. 2015.08.08

බී. ආර්. පියසේන, අවු 88. අකුරු ලිවීමට කියවීමට හැකියාව නොමැත. පාරම්පරික කම්මල්කරුවෙකි, සම්මුඛ සාකච්ඡාව, දියමාරුතැන්න, ඇත්පට්ටිය, බිබිලේගම, බඩල්කුඹුර. 2015.11.02

එච්. එම්. බණ්ඩාරමැණිකා, අවු 90. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. ගොවිතැන, සම්මුඛ සාකච්ඡාව, අක්කර 12, මඩුගස්මුල්ල, බඩල්කුඹුර. 2013.04.20

ජේ. එම්. පේමාවතී, අවු 69. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. ගොවිතැන, සම්මුඛ සාකච්ඡාව, අංක 59, දහම්ගම, නන්නපුරාව. 2016.03.17

එන්. එම්. කුමාරිහාමි, අවු 84. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. ගොවිතැන, සම්මුඛ සාකච්ඡාව, දයාවාස වලව්ව, ඇත්පට්ටිය, බඩල්කුඹුර. 2014.01.27, 2016.07.12

යූ. එල්. බෙබිනෝනා, අවු 70. අකුරු ලිවීමට කියවීමට හැකියාව ඇත. ගොවිතැන, සම්මුඛ සාකච්ඡාව, නිශාන්ත ස්ටෝර්ස්, 8 කණුව, බිබිල, මැදගම. 2014.11.12, 2015.07.02